# බස්නාහිර පළාතේ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනයක්

**ඒ. ඒ. පී. එම්. මධුභාෂිණී**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අග නගරය මෙන්ම වාණිජ නගරය වීමත් පරිපාලන ආයතන රැසක් පිහිටා තිබීමත් නිසා කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගත් බස්නාහිර පළාත ලංකාවේ වැඩිම ජනගහනයක් සිටින පළාත වේ. මේ නිසාම බස්නාහිර පළාත තුළ ආර්ථික, සමාජීය, දේශපාලනික, පාරිසරික ගැටලු රැසක් උද්ගතවී තිබේ. 'ඩෙංගු' අද නිරන්තරයෙන් කතාබහට ලක්වන ගැටලුවකි. ඩෙංගු රෝගයේ සීඝ්‍ර ව්‍යාප්තිය නිසා මිනිසාගේ කායික මානසික නිදහසට බාධා පැමිණීම, සෞඛ්‍ය වියදම වැඩිවීම, විභව නිමවුම අඩුවීම නිසා ආර්ථික සංවර්ධනයට බාධාවන තත්වයක් උද්ගත වී තිබේ. මේ නිසා බස්නාහිර පළාත තුළ ඩෙංගු රෝගය බහුල වශයෙන් ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමත් එම සාධක ඉවත් කිරීම සඳහා කටයුතු කළයුතු ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ද්විතීයික දත්ත ඇසුරින් රැස්කරගත් දත්ත, විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම ඇසුරින් විශ්ලේෂණය කරන ලදී. මේ අනුව ජනගහනයේ ව්‍යාප්තිය හා ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය අතර අනුලෝම සම්බන්ධයක් පවතින බව අනාවරණය විය. අධික ජනගහනය හේතුවෙන් අපද්‍රව්‍ය හා ජලය බැහැර කිරීම විධිමත් ආකාරයෙන් සිදු නොවීම නිසා මෙම ප්‍රදේශය තුළ ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය වැඩි වී තිබේ. ඩෙංගු රෝගයේ ව්‍යාප්තියට 47% ක දායකත්වයක් දක්වන්නේ භාජන වල ජලය එකතු වීමයි. මේ නිසා අනෙක් පළාත් වලට සාපේක්ෂව කසල කළමනාකරණ වැඩසටහන් විධිමත් ලෙස පැවැත්වීම, පරිසරය පිරිසිදුව තබා ගැනීම හා මදුරු මර්දන වැඩසටහන් වසරකට වැඩි වාර ගණනක් පැවැත්වීම සිදු කළ යුතු වේ.

**මුඛ්‍ය පද :** ඩෙංගු රෝගය, බස්නාහිර පළාත, ජනගහනය

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, aapmm.piyumi@gmail.com